# නැගෙනහිර වෙරළාශ්‍රිත ඉදිවූ මණිනාගපබ්බත විහාරයේ චෛත්‍ය ඉදිවූයේ නාවුක කටයුතු හැසිරවීමට ද?

අයි.ඒ.වී.පී.කේ. කුමාරි[1]

ශාස්ත්‍රවෙල මණිනාග පබ්බත බෝධිගිරි විහාරය ක්‍රි.පූ. 2-1 සියවස අතර කාලයේ දී ගොඩනැගුණකි. අක්කර දෙසීයක පමණ භූමි ප්‍රදේශය පුරා පුරාවිද්‍යාත්මක සාධක ඇති මෙම විහාරස්ථානය ඉදිකිරීමටත් ස්ථානගත වීමටත්, මෙම කලාපය ආශ්‍රිතව පැවති ආර්ථික හා නාවික කටයුතු ඉවහල් වූ බවට උපකල්පනය කරන අතර ඒ පිළිබඳව අනාවරණය කරගැනීම අරමුණ වේ. අධ්‍යයනයට අදාළව ප්‍රධාන වශයෙන් මතුපිට සාධක ගවේෂණය, සිතියම් අධ්‍යයනය, භූ ලක්ෂණ අධ්‍යයනය සහ එම සාධක අතර අන්තර් සම්බන්ධතාවය පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ. හැඩඔයේ විශාලතම අපශාඛාව වන කුඩාකල්ලුව මුහුදට එක්වන ස්ථානය ආශ්‍රිතව හා හැඩ ඔයේ දකුණු ඉවුරේ තරමක් ගොඩබිම දෙසට වන්නට පිහිටි සිඝ්‍ර බෑවුම් ලක්ෂණ අනුව වරායක් හෝ නෞකා යාත්‍රාවන්ට මග පෙන්වන ස්ථානයක් බව හඳුනාගත හැකිය. කුඩා කල්ලුවේ දකුණු ඉවුරේ මෝය කට අබියස වර්තමාන ආවාස ගෘහයට කි.මී. 2 දුරින් මුහුදට නෙරාගිය ගල්පර්වත සහිත අක්කර දෙකක පමණ ගොඩබිම මත හඳුනාගත හැකි අඩි තිහක පමණ විශ්කම්භයකින් යුත් ගොඩැල්ල චෛත්‍යක් තිබූ බවට සාධකයකි. මෙය වර්තමානයේ ලංකා සෑය නමින් හඳුන්වන අතර එය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරය ආශ්‍රිත සාගරයේ යාත්‍රා කරන යාත්‍රාවන්ට හොඳින් දර්ශනය වන ලෙසින් ගොඩනගා තිබේ. එය එකල ආගමික අරමුණින් ඔබ්බට ගොස් වර්තමාන ප්‍රදීපාගාරයක කාර්යය ඉටුකර ඇති බව උපකල්පනය කරගත හැකිය. ඒ ආශ්‍රිතව ස්වාභාවික භූ රූපයක් වන වෙරළ බොකු ලක්ෂණය ද මෙම අදහස වඩාත් තහවුරු කරනු ලබයි. ගොඩබිමට වන්නට හැඩ ඔයේ දකුණු ඉවුරේ පිහිටා ඇති සීඝ්‍ර බෑවුම මත පිහිටි චෛත්‍ය ත්‍රිත්වයකින් යුත් නටබුන් ද මෙම ස්ථානයේ ඇති සුවිශේෂී ඉදිකිරීමකි. චෛත්‍ය ත්‍රිත්වය එක් රේඛාවක පිහිටන ලෙසින් ඉදිකර ඇති අතර ගොඩබිමින් පොතුවිල් දෙසින් පැමිණෙන්නන් හටද මුහුදු යාත්‍රාවලට ද එක ලෙස දෘශ්‍ය වේ. ඒ අනුව එය යම් මාර්ග සංඥාවක් ලෙසින් නිර්මාණය කර ඇති බව උපකල්පනය කළ හැකිය. පර්යෙෂණයට අදාළව හමුවන සුවිශේෂී සාධකය වන්නේ ශ්‍රී ලංකාව දැක්වෙන ඉතා පැරැණි සිතියමකි. එහි මෙම ස්ථානයට ආසන්නතවම පිහිටි පානම PANAMA දක්වා තිබේ. එයින් පානම යන ස්ථානය වෙත යම් මගපෙන්වීමක් මේ හරහා කරන ලදැයි උපකල්පනය කළ හැකිය. තව ද මෙම විහාරස්ථානය අරියවංශ සූත්‍ර දේශනය පැවැත්වූ ස්ථානයක් වන බව සෙල්ලිපි මගින් තහවුරු වන අතර ඒ සඳහා ඈත ප්‍රදේශවල සිට සහභාගි වූ පිරිස වෙත මගපෙන්වන මං සලකුණු මේ ආකාරයෙන් ඉදි වූ බව ද උපකල්පනය කිරීමට හැකිය. මෙම සාධක පිළිබඳව සලකා බැලීමේදී ශාස්ත්‍රවෙල මණිනාග පබ්බත බෝධිගිරි විහාරය ආශ්‍රිත ඉදිකිරීම් ආගමික පදනමින් ඔබ්බට ගොස් නාවුක හා ගොඩබිමින් සිදුවූ ගමනාගමන කටයුතු සඳහා ද ඉවහල් වන ලෙසින් ඉදිකර ඇති බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** මණිනාග පබ්බත බෝධිගිරි විහාරය, චෛත්‍ය නටබුන්, නාවුක කටයුතු

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. priyamalikalani@gmail.com